# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1657/14 - 2010 ජුනි 08 වැනි අඟහරුවාදා - 2010.06.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට මහනුවර දකුණ ජල සම්පාදන ව්‍යාපෘතියේ කෙහෙල්වල පීඩන සිදින ටැංකිය ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2010 ජුනි මස 03 වැනි දින,
නාවල, නාරාහේන්පිට පාර,
අංක 34,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/884

#### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 129 කිරිබත්කුඹුර (නැගෙනහිර) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කෙහෙල්වල ගමේ පිහිටි උඩමුදුන හේන හෙවත් පරණවත්ත නමැති ඉඩම පෙන්නුම් කෙරෙන බලයලත් මිනින්දෝරු අයි. විජේකෝන් මහතා විසින් පිළියෙල කරන ලද අංක ඩබ්බී/3/2009 දරන පිඹුරේ කැබලි අංක 01 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0026 (පර්චස් 1.02) ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :—

*උතුරට* : එම ඉඩමේ ඉතිරි කොටස ;

*නැගෙනහිරට* : එම ඉඩමේ ඉතිරි කොටස ;

*දකුණට* : කෙහෙල්වල පොම්පීකරණ නල මාර්ගය සඳහා මණ්ඩලය මගින් අත්කර ගන්නා ලද ඉඩම ;

*බටහිරට* : එම ඉඩමේ ඉතිරි කොටස.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : අනෝමා වී. වලිසුන්කර මිය, උඩමුදුන, 5 කණුව, මුරුතලාව.

06-507/1

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට රුහුණුපුර ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ජල මූලාශ්‍රය ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, අත්කර ගැනීමට යෝජිත මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2010 ජුනි මස 03 වැනි දින,
නාවල, නාරාහේන්පිට පාර,
අංක 34,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/880

**උපලේඛනය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගොඩකොග්ගල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රිදියගම ගමේ මහලකන්ඩිය *නොහොත්* කිවුලේකැලේ නමැති ඉඩම පෙන්නුම් කෙරෙන බලයලත් මිනින්දෝරු එම්. ජී. නසූර් මහතා විසින් පිළියෙල කරන ලද අංක 217 පිඹුරේ කැබලි අංක 01 හි දැක්වෙන හෙක්ටයාර් 0.50089 (අක්කර 1, පර්චස් 38) පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :—

*උතුරට* : රිදියගම සිට සූරියවැවට යන මහා මාර්ගය ;

*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;

*දකුණට* : ඇල ඉවුර ;

*බටහිරට* : ඇල ඉවුර සහ රිදියගම සිට සූරියවැවට යන මහා මාර්ගය.

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්* : 01. වී. කේ. දයානන්ද මහතා, රිදියගම, අම්බලන්තොට.

02. වී. කේ. සිරිල් මහතා, රිදියගම, අම්බලන්තොට.

06-507/2

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට රුහුණුපුර ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ජල පවිත්‍රාගාරය ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍ය වී ඇති හෙයින්, අත්කර ගැනීමට යෝජිත මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2010 ජුනි මස 03 වැනි දින,
නාවල, නාරාහේන්පිට පාර,
අංක 34,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/879

### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 136, වැදිවැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බුරුතකන්ද ගමේ මහවැලි ඉඩම (ස්වර්ණභූමි) නමැති ඉඩම පෙන්නුම් කෙරෙන බලයලත් මිනින්දෝරු එම්. ජී. නසූර් මහතා විසින් පිළියෙල කරන ලද අංක 216 පිඹුරේ කැබලි අංක 01 හි දැක්වෙන හෙක්ටයාර් 1.61885 (අක්කර 4) පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :—

*උතුරට* : ප්‍රැන්තිස් මහතා සහ එස්. ආර්. ජී. බුද්ධදාස මහතා හිමිකම් කියන ඉඩම් ;

*නැගෙනහිරට* : කේ. ඩී. කිරිගෝරිස් මහතා හිමිකම් කියන ඉඩම ;

*දකුණට* : ඩබ්. එම්. කමලසේන මහතා සහ ඩබ්. සිරිපාල මහතා හිමිකම් කියන ඉඩම්. ;

*බටහිරට* : අම්බලන්තොට සිට සූරියවැවට යන මහා මාර්ගය.

.

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්* : 01. ඩී. එස්. පී. පියදාස මහතා,
වැදිවැව, සූරියවැව.

02. එස්. දිසානායක මහතා,
වැදිවැව, සූරියවැව.

06-507/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.